# Living the Lotus 4

2024

VOL. 223

*Buddhism in Everyday Life*




Rissho Kosei-kai of


**Living the Lotus**
**Vol.223 (April 2024)**

Senior Editor: Keiichi Akagawa
Editor: Sachi Mikawa
Copy Editors: Ruklanthi Palipana,
Sahan Chamara, Rajitha Madurangha
published by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.


TEL: +81-3-5341-1124 FAX: +81-3-5341-1224
mail: living.the.lotus.rk-international@kosei-kai.or.jp


රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමි ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිච්කෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මුලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යාප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සැම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජීවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.



# යථාර්තය ඇති සැටියෙන් පිළිගනිමු

නිච්කෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

## ‘සත්‍යය’ යනු?

‘ගල් පර මත කඩා හැලෙන දිය පහරක ඉවුරේ, වරබි අංකුර දළු ලෑමට පටන් ගන්නා විට, වසන්තය පැමිණේවි’ මෙම කවිය, ගල්පර අතරින් කඩා හැලෙන දිය ඇල්ලක් අසල අලුතින් දළුලන වරබි අංකුරයක් දුටු ෂිකි කුමරු විසින් (තෙන්ජි අධිරජ්‍යයාගේ හත්වන කුමරු) වසන්තය උදාවීමේ සතුට වෙනුවෙන් කල රචිතයකි. මෙය නරා යුගයේ සම්පාදනය කල මන්යෝෂු කාව්‍ය සංග්‍රහයේ එක් කවියක් වන අතර, මෙම කවිය ලියා සියවස් ගණනාවක් ගතවුවත්, වර්තමානයේ ජීවත්වන අපටද ‘වසන්තය උදාවීමේ ඇති’ උද්වේගකර හැඟීම ගෙන දෙන අපූරු ජපන් කාව්‍යයකි.

කෙසේ වුවද, අපට මන්යෝෂු රචිත නරා යුගයේ ජීවත්වූ ජනතාව මෙන් පැහැදිලි දෑසින් ස්වභාව ධර්මය අගය කිරීමටත්, ඇති සැටියෙන් දේවල් කෘතඥපූර්වකව සහ ප්‍රීතියෙන් පිළිගැනීමටත් නොහැකි වී ඇත. මෙම කවි තුලින් අපගේ හදවත්වල ඇති අඳුරු බව සහ අඩුපාඩු පෙන්වා දේ.

තවද, කසීභාරද්වාජ සූත්‍රයේ ශාක්‍යමුණි බුදුන් සහ බ්‍රාහ්මණයෙක් අතර සිදු වූ සංවාදයක ‘සත්‍ය සුරැකීම, මා විසින් කරනා ගොයමෙහි වල්පැල ගැලවීමයි’ යනුවෙන් සඳහන්ව ඇත. ශාක්‍යමුණි බුදුන් වහන්සේට අනුව, ‘සත්‍යය සුරැකීම’ ගොවියෙකු විසින් කරනා ගොයමෙහි වල්පැල ගැලවීමේ ක්‍රියාවට සමානය.

එසේනම්, මෙම ‘සත්‍යය’ යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? එය සුරැකීම යනුවෙන් අදහස් වනුයේ කුමක්ද?

‘සත්‍යය’ යන වචනය ඇසෙන විට පළමුව සිහියට නැගෙනුයේ ‘සත්‍ය වූ ධර්මය’ වේ. බුදුදහම එක් එක් පුද්ගලයා සත්‍යය වූ ධර්මය අවබෝධ කර ගැනීම වැදගත්කොට සලකන නිසා, ‘සත්‍යය සුරැකීම’ යනු සත්‍යය වූ ධර්මයට අනුකූලව ජීවත් වීම ලෙස අර්ථ දැක්විය හැක. තවද, බෞද්ධ ශබ්දකෝෂයේ ‘සත්‍යය’ යන්න ‘යථාර්තය ඇති සැටියෙන්’ සහ ‘යථාර්තය පවතින සැටියෙන්’ දැකීම ලෙස අර්ථ දක්වා තිබේ. මෙම දෘෂ්ටිකෝණයෙන් බලන විට, කැමති අකමැති හැඟීම්වලින් තොරව, යථාර්තය ඇති සැටියෙන් දැකීම සහ යථාර්තය පවතින සැටියෙන් පිළිගැනීම ‘සත්‍යය සුරැකීම’ වන අතර, ශාක්‍යමුණි බුදුරදුන්ද එය වළක්වන ලෞකික ආශාවන් නම් වල් පැළෑටිවලින් තම හදවත ආක්‍රමණය නොකරන ලෙසට වගබලාගත් බව මම විශ්වාස කරමි.

## අන්‍යයතාවක් නොමැති වල් පැළෑටි නොමැත

කෙසේ වුවද ලෞකික ආශාවන්, අපගේ ප්‍රගතිය සහ දියුණුවට ගාමක බලවේගය වන අතර, 'ලෞකික ආශාවන් ඇති නිසාවෙන් නිර්වාණයට ළඟාවීමට උත්සහ කරයි' යන කියමනට අනුව, ලෞකික ආශාවන් සහ නිර්වාණය අවසානයේදී එකක් බවට පත් වන බව පැවසේ. මිනිසුන් දැඩි ලෞකික ආශාවන්ගේ හිමිකරුවන් බව බැවින්, සත්‍යය අවබෝධ කරගැනීමේ ශක්තිය පවතීනම්, ලෞකික ආශාවන් අපව ජීවත් කරවන සහ අපව පෝෂණය කරනු ලබන ආශිර්වාදය බවට පත් වේ. මිනිසුන්ට දැඩි ලෞකික ආශාවන් ඇතිවන තරමට, එයින් හදවතේ විශාල වෙනසක් ඇති කරගත හැකි වේ. ශාක්‍යමුණි බුදුරදුන් මෙහි 'වල්පැල ගැලවීම' යනුවෙන් අර්ථ දැක්වූවේ, අප ප්‍රවේශම් නොවුණහොත් අපගේ සිතේ වැඩෙන ලෞකික ආශාවන් නමැති වල් පැළෑටි වැඩිම වැළැක්වීමට කපා දමමින්, පස බුරුල් කල යුතු බවයි. එවිට අපගේ හදවත පුළුල් වී, ප්‍රඥාව ඇති කරන පෝෂණය බවට පත් වන අතර, එයින් හදවත සහ මනස සරල බවින් පොහොසත් වී මෘදු වේ.

වල් පැළෑටි පිළිබඳව පැවසීමේදී, ශාක වර්ගීකරණ විද්‍යාඥයෙක් වන තොමිතරෝ මකිනො මහතා විසින්, 'වල් පැළෑටි' යනුවෙන් කියැවුණු වාර්තාකරුවෙකුට 'මේ ලෝකයේ වල් පැළෑටි නමින් තෘණ නොමැත. සෑම තෘණ වර්ගයකටම නමක් ඇත' යනුවෙන් අවවාද කල ප්‍රසිද්ධ කතාවක් තිබේ. මීට අමතරව, මෙම ලිපියෙන් අපගේ සිතේ වල් පැළෑටිවලට සමාන කල සෑම ලෞකික ආශාවකටම අර්ථයක් සහ වටිනාකමක් පවතී. ලෞකික ආශාවන්, කිසිම වටිනාකමක් නැති ලෞකික ආශාවන් ලෙසම අවසන් වීමට ඉඩ හරිනවාද, නැතහොත් ආධ්‍යාත්මික වර්ධනයට මඟ පාද ගන්නා ලෞකික ආශාවන් බවට පත්කර ගන්නවාද යන්න තීරණය කිරීම අප සතුය.

මෙම වසර මුල නෝතෝ අර්ධද්වීපයේ ඇති වූ භූමිකම්පාවෙන් දරුණු හානියක් සිදු විය. අපි සිතන්නේ භූමිකම්පාව දරුණු ව්‍යසනයක් ලෙසයි. නමුත් පෘථිවි ඉතිහාසය දෙස බලන විට, මේ මොහොතේදීත් භූමිකම්පා සක්‍රීයව පවතින ස්වභාවික සංසිද්ධියකි. සත්‍යයට ඇති සැටියෙන් මුහුණ දීමද, ව්‍යසනය මිනිස් ප්‍රඥාවට සම්බන්ධ කරන වැදගත් ක්‍රියාවලියක් ලෙස පැවසිය හැක. නමුත්, ව්‍යවසනයන්ගෙන් විපතට පත් වූවන්ගේ කටුක තත්වය දකින විට, හැඟීම් දැනීම්වලින් තොරව යථාර්ථය පිළිගත නොහැකිය. එසේම, භූමිකම්පාවෙන් මරණයට පත් වූවන් පිළිබඳව ශෝක වීමත්, භූමිකම්පාවෙන් හානිවූ ප්‍රදේශ තවමත් යතාතත්වයට පත්ව නොමැතිව දුෂ්කර ජීවිත ගත කරන පුද්ගලයන් පිළිබඳව නොසිතා සිටිය නොහැක.

අපි සත්‍යයට මුහුණ දෙමින් හා සත්‍යය පිළිගනිමින්, විවිධ චිත්තාවේගයන් සමඟ ගැටෙන විට, යහපත් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය ප්‍රඥාවත් අන් අය ගැන සිතීමේ මෛත්‍රී සහගත හැඟීමත් වර්ධනය වේ. එය අප ජිවිත කාලයේ ලබන ආධ්‍යාත්මික දියුණුව ලෙස පැවසිය හැකිවේ.



අප්‍රේල් මස 'කෝසෙයි' සඟරාව ඇසුරිණි

# Interview

## අන්‍යයන් ගැන සිතන, දුකට ඇහුම්කන්දෙන්නෙකු බවට පත්වුනෙමි

**චෝ උගී මිය**
**කොරියානු ධර්ම ශාඛාව**

**ධර්ම ශාඛාවේ ක්‍රියාකාරකම් සඳහා සම්බන්ධවීමට හේතු වූ කාරණාව කුමක්ද, සම්බන්ධ වූයේ කුමන කාලයේදීද?**

1989 අවුරුද්දේ මගේ අම්මා රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වූ නිසා, මා දෙවන පරම්පරාවේ සාමාජිකයෙකු වනවා. මම මුලින්ම ධර්ම ශාඛාවට ගියේ මම කනිෂ්ඨ පාසල් අධ්‍යාපනය ලබන කාලයේදී. පසුව රැකියාවට සම්බන්ධ වී, විවාහ වී දරුවන් ලැබීම නිසා සුවිශේෂී උත්සව අවස්ථාවන් වලදි පමණක් ධර්ම ශාඛාවට යමින් කටයුතු කලා.

පසුව 2022 අවුරුද්දේ අගෝස්තු මාසයේ සිට මම නැවත ධර්ම ශාඛාවට යාමට, 2018 අවුරුද්දේ, මගේ හොඳ මිතුරෙකු වූ A සාන් සමග තිබුනු මිත්‍රත්වය පළුදු වීම හේතු වුනා. ඒ වනතෙක්ම මම A සාන්ව තදින්ම විශ්වාස කල අතර මගේ සෑම දෙයක්ම ඔහු සමග පැවසුවා. නමුත්, දිනක් මාව කනස්සල්ලට පත් කරන සිදුවීමක් සිදු වූවා.

එම සිදුවීමෙන් කම්පනයට පත් වූ මා හදවත සන්සුන් කරගැනීමට හෝසා වටයන් වලට සහ ධර්ම ශාඛාවට ගොස් සූත්‍ර සජ්ඣායනයන්ට සම්බන්ධ වූවා. A සාන් සමග ඇති වූ ගැටලුව ගැන ධර්ම නායකයින් සමග කතාබහ නොකල නමුත්, ඉගැන්වීම් වලට ස්තුතිවන්ත වන්නට මම A සාන්ට දොස් පවරනවා වෙනුවට ඔහුගේ සතුට ප්‍රාර්ථනා කරන්න



සාවදනයෙන් යුතුව හෝසා වටයට
සහභාගී වී සිටින චෝ සාන්



සම්මුක පරීක්ෂණයට මුහුණ දෙන චෝ උගී සාන්

හැකිවී තිබෙනවා.

**මේ වන විට නියෝජ්‍ය ධර්ම නායක ලෙස කටයුතු කරමින් සිටින නමුත්, රාජකාරී කිරීමට ලැබුණු මොහොතේම එය පිළිගනිමින් කටයුතු කලාද?**

මම 2022 අවුරුද්දේ අගෝස්තු මාසයේ සිට ධර්ම ශාඛාවට යාමට පටන්ගත් බව කලින් පැවසුවත් ඒ වන විටත් මා රැකියාවේ නිරතව සිටි නිසා සති අන්තයේ පමණක් ධර්ම ශාඛාවට යමින් කටයුතු කලා. නමුත් මම 2023 අවුරුද්ද අවසන්භාගයේ රැකියාවෙන් ඉවත්ව, දැන් ගෘහණියක් ලෙසටත් ධර්ම ශාඛාවේ රාජකාරී කටයුතු වලට අවධානය යොමුකිරීමටත් හැකිවී තිබෙනවා. මම සහ මගේ ස්වාමියාත් දරුවන් දෙදෙනාත් ඇතුළුව හතර දෙනෙකුගෙන් යුත් පවුලක් මට තිබෙන අතර, මගේ දරුවන් දෙදෙනාම මේවන විට විශ්ව විද්‍යාල සිසුන් ලෙස අධ්‍යාපනය ලබමින් සිටින නිසා ඔවුන් ගැන කරදර වියයුතු නොමැති නිසා, රැකියාවක ප්‍රශ්න නොමැති නිසාත්, නිවසේ වැඩකටයුතු සැහැල්ලු වූ නිසාත් ධර්ම ශාඛාවේ රාජකාරීන්ට අවධානය යොමු කිරීමට හැකියි කියා මට හැගෙනවා. මට ලැබුණු වගකීම කෘතවේදීව සතුටෙන් භාරගන්නා අතර, මෙය බුදුන් වහන්සේගෙන් ලැබුණු රාජකාරියක් යැයි සිතනවා.

**ලැබී තිබෙන රාජකාරිය තුල සතුටක් ලබන්නේ කුමන ආකාරයේ ක්‍රියාවන් තුලින්ද?**

මම රාජකාරී බාරගැනීමට කලින් සිටම ධර්ම ශාඛාවේ වැඩ වලදී එතරම් ක්‍රියාශීලී පුද්ගලයෙකු නොවූ නමුත්, 2023 අවුරුද්දේ අගෝස්තු මස 01 වෙනිද රාජකාරී බාරගත් මොහොතේ සිට රාජකාරීන්ට මූලිකත්වය දී වගකීමෙන් කටයුතු කරන්නත්, මගේ කොට්ඨාශය තුල ක්‍රියාකාරී වීමටත් හැකිව තිබෙනවා. මා දෙස බලා ඉගෙන ගන්නා පුද්ගලයින් සිටින්න පුලුවන් කියා සිතමින්, මගේ භූමිකාවට හැකි උපරිම සාධාරණයක් ඉටුකිරීමට මම බලාපොරොත්තු වනවා. මේ හැඟීම ලැබුණු භූමිකාවේ මෙහෙවර කියා කිව හැකිදැයි වැඩි තේරුමක් නොමැති නමුත්, එය රාජකාරියෙන් ලද ආනිසංස යැයි සිතනවා.

**තෙදොරි, මිච්බිකි තුලින් වටහාගත්, ඉගෙන ගත් කරුණු මොනවාද?**

දැනට, මට සමීපතම මිතුරන්දෙදෙනෙකු සිටින අතර, ඉන් එක් මිතුරෙකු වන B සාන්, මම 2022 අවුරුද්දේ ධර්ම ශාඛාවට පැමිණීම ආරම්භ කල කාලයේ ධර්ම ශාඛාවට පැමිණෙන්න කියා ආරාධනා කල පසු පැමිණ සීත ඍතුවේ සූත්‍ර සජ්ජායනයටද සහභාගී වූවා. පසුව 9 වන මාසයේ B සාන්ගේ නිවසේ බුද්ධ රූපය තැම්පත් කර සාමාජිකත්වය ලබාදීමට හැකිවීම කෘතවේදී කාරණාවක් වූවා.




ධර්ම ශාඛාවේ උත්සවයක බෙර වාදනයෙන් සහාය වන චෝ සාන්

අනෙක් මිතුරා C සාන් මා සිටිනා ප්‍රදේශයේ බැට්මින්ටන් ක්ලබ් එකතුලදී හමු වූ මිතුරෙකු වූ අතර, ඔහුව මිච්බිකි කිරීමේ අරමුණින් ඔහුටත් ධර්ම ශාඛාවට පැමිණෙන්න කියා ආරාධනා කල පසු ඔහුත් පැමිණියා. ඒ මොහොතේ, C සාන්ට සාමාජිකත්වය ලබාදිය යුතුයි යන මගේ දැඩි ප්‍රාර්ථනය නිසාදෝ C සාන් පිළිබඳ අවධානය ප්‍රමාණවත් නොවීම නිසා ඔහු ධර්ම ශාඛාවෙන් ඈත් වූවා. ඇත්තෙන්ම C සාන්ගේ සිදුවීම ගැන මම දැන් කනස්සල්ලට පත් වනවා. මෙම අත්දැකීම් තුලින් මා, අන් අයගේ හදවතේ හැඟීමට පත්ව ඔවුනට සංවේදීව සවන්දීමේ වැදගත්කම ඉගෙන ගත්තා.

**දේශනයන් හෝ හෝසා වලට සහභාගී වීමෙන් තදින්ම හදවතට දැණුනු කාරනාව කුමක්ද?**

මම මුල් වරට ධර්ම ශාඛාවට ගිය අවස්ථාවේ ඉගෙනගත් 'තමන් වෙනස් වුවහොත් අනෙක් පුද්ගලයන්ද වෙනස් වනවා' යන කරුණ අදටත් මගේ හදවතේ එලෙසම තිබෙනවා. ඊට පෙර මා 'අන් අයව වෙනස් කලයුතුයි' කියා සිතා කටයුතු කලා. නමුත් කල්පනා කර බැලූ විට තමන්ට තමාව වෙනස්කල හැකි නමුත්, තමන්ට අන් අයව වෙනස් කල නොහැකියි. එනිසා අන් අයව වෙනස් කිරීමට වෙහෙස නොවී, තමන්ගේ දෘෂ්ටිකෝණය, සිතන පතන ආකාරය වෙනස් කර ගැනීමට උත්සහ කිරීම වැදගත් වේ. ඇත්තෙන්ම තමන් වෙනස් වනවානම්, සිදුවීම් දෙස බලන ආකාරය, සිතන ආකාරය ධනාත්මක ලෙස වෙනස්වනවා කියා ඉගෙන ගත්තා.

**රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ වඩාත්ම සිත් ඇදගන්න සුළු කාරණය කුමක්ද?**

කොරියාවේ බොහෝ සාම්ප්‍රධායික බෞද්ධ පන්සල් තුල ප්‍රධාන ස්වාමීන් වහන්ස සූත්‍ර සජ්ජායන කිරීම ධර්ම දේශනයන් පැවැත්වීම සිදුකරන අතර, සාමාන්‍ය ජනයා පංසිල් රකිමින් කටයුතු කරයි. මෙය ඉතාමත් වටිනා කාරණා ලෙස මම පිළිගන්න නමුත්, රිෂ්ෂෝ කෝසෙයිකායි සංවිධානයේදි අපි, පුද්ගලිකව උදේ සවස සූත්‍ර සජ්ජායනය කරමින් හෝසා පවත්වමින් මිච්බිකි, තෙදොරි කරමින් විවිධ ක්‍රියාකාරකම් සිදු කරනවා. ඒ ආකාරයට තමන් විසින්ම ක්‍රියාකාරකම් කරමින් ධර්මය ප්‍රායෝගිකව පුහුණු කිරීමට හැකිවීම වඩාත්ම සිත් ඇදගන්නා කාරනාව කියා මා සිතනවා.

**ඔබගේ අරමුණ කුමන ආකාරයේ නායකයෙකු වීමටද?**

මම වඩාත්ම අගය කරන සහ අරමුණු කරන පුද්ගලයා ලී කියෝකයිචෝ සාන්. කියෝකයිචෝ සාන් නිතරම, බුදුන් වහන්සේගේ ධර්මය විශ්වාස කරමින්, නිර්මාතෘ තුමාගේ සහ නිචිකෝ නිවානෝ තුමාගේ ඉගැන්වීම් නිවැරදිව කියාදීමට උත්සහ කරන, සාමාජිකයින් වන අපට තේරුම් ගැනීමට පහසු ආකාරයෙන් කතා කරනවා. පරමාදර්ශය ටිකක් විශාල වුවත් මම ලී කියෝකයිචෝ සාන් වැනි නායකයෙකු වීමට සිතනවා.

**අනාගත ඉලක්කයන් සහ අරමුණු මොනවාද?**

2023 අවුරුද්ද දෙස ආපසු හැරී බලන විට, මගේ ක්‍රියාකාරකම් තුලින් ධර්ම ශාඛාවේ මෙන්ම මගේ ප්‍රදේශයේ සමාජිකයින් හට මාව හඳුන්වා දීමට හැකි වූ අවුරුද්දක් කියා මා සිතනවා. 2024 අවුරුද්දේ, ධර්මය විශ්වාස කරන පුද්ගලයෙකු ලෙස පියවරක් ඉදිරියට යාමට බලාපොරොත්තු වනවා. මගේ ඉලක්කයන්ට තවමත් දුරින් සිටින නමුත්, ධර්ම ශාඛාවේ රාජකාරීන් තුල පියවරක් ඉදිරියට යාමට පෙරට වඩා වෙහෙසී කටයුතු කිරීමට බලාපොරොත්තු වනවා.

මේ සඳහා අන් අය කෙරෙහි අවධානය යොමුකරමින් සැලකිලිමත්ව ඔවුන්ගේ දුක් වේදනාවන්ට සවන්දිය හැකි, ඔවුන්ගේ දෘෂ්ටිකෝණයෙන් ඔවුන් ගැන සිතා කටයුතු කිරීමට හැකි අනුකම්පා කල හැකි අයෙකු ලෙස වර්ධනය වීමට උත්සහ කරනවා. ඒ වගේම නිවස තුල ධර්ම පුහුණුව අමාරු වුවත් එක් ධර්ම කරුණක් හෝ පුහුණු කල හැකි හොඳ බිරිඳක් සහ මවක් වීමට උත්සහ කරනවා.



පවුලේ සාමාජිකයින් සමග


# රිෂ්ෂෝ කෝසෙයි කායි හැඳින්වීම


## සාමාජිකයෙකු බවට පත්වූ විට

### බුදු පිළිම වහන්සේ තැන්පත් කිරීම

රිෂ්ෂෝ කෝසෙයිකායි සංවිධානයේ බුදු මැදුර, 'ගොහෝසෙන්' ලෙස හඳුන්වයි. සාමාජිකයෙකු බවට පත්වූ විට එම බුදු මැදුර (ගොහෝසෙන්) තුලට ගොහොන්සොන් (සදතනික ආදිබුද්ධ ශාක්‍යමුණී බුදුන් වහන්සේගේ පිළිමය), ගොහෝගෝ (නික්යෝනිවානෝ තුමාගේ සහ මියෝකෝ නගනුමාතුමියගේ ගෞරවනීය නාමයන්), සෝකයිමියෝ (සාමාජිකයන්ගේ, ආදී මුතුන් මිත්තන්ගේ නාමයන්), තකුචිඉන්නෙන් කයිමියෝ (නිවස සහ වාසය කරන ප්‍රදේශයේ මියගිය අය වෙනුවෙන් වූ සූත්‍ර සජ්ජායනා) මේ සෑම දෙයක්ම ගෞරවයෙන් යුතුව පිළිගෙන බුදු කුටිය තුල තැන්පත් කරයි.

බුදුපිළිම වහන්සේ තැන්පත් කිරීමේදී ඒ සඳහා සහභාගිවන සියළු සාමාජිකයන් එකට එක්ව සූත්‍ර සජ්ජායනා කරමින් ධර්මය ඉගෙන ගනිමින් ප්‍රායෝගිකව පුරුදු පුහුණු කරමින් ක්‍රියාවට නංවන බවට ප්‍රතිඥාදෙයි.








**දැනුමට යමක්**

'නමු මියෝ හෝ රේන්ගේ ක්යෝ' යනුවෙන් සෑම දිනකම ඔදයිමොකු සජ්ජායනය කරනු ලබයි. 'නමු' යනු 'විශ්වාස කිරීම' යන අර්ථයවේ. 'මියෝ හෝ රෙන් ගේ ක්යෝ' යනු 'සද්ධර්මපුණ්ඩරික සූත්‍රය' යන්නයි. එබැවින් 'නමු මියෝ හෝ රේන්ගේ ක්යෝ' යන්නෙන් අදහස් කරන්නේ සද්ධර්ම පුණ්ඩරික සූත්‍ර ධර්මය හදවතින්ම විශ්වාස කරමින් ප්‍රායෝගිකව පුරුදු පුහුණු කරන පුද්ගලයෙකු බවට පත්වීම යන අර්ථයවේ.

※ කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.

# බුදු මැඳුර






සෑම නිවසකම බුදුකුටිය තුල බුදු පිළිම වහන්සේ, සෝකයිමියෝ (ආදී මුතුන්මිත්තන්ගේ නම්), තකුචි ඉන්නෙන් කයිමියෝ (හදවතින්ම පිළිගෙන) තැන්පත් කිරීම සිදුකරයි.

එසේම බුදුකුටිය තුල තැන්පත් කර තිබෙන බුදුපිළිම වහන්සේට, ආදී මුතුන් මිත්තන්ට හදවතින්ම මල්, පැන්, ගිලන්පස ආදිය පූජා කරනු ලබයි.

එසේම කෘතවේදී හැඟීමෙන් දවස ආරම්භ කරමින්, යහපත්දේ කිරීමට ප්‍රාර්ථනා කරමින්, තමා සිදුකල ක්‍රියාවන් පසුවිපරම් කරමින් කටයුතු කලයුතු වෙයි. උදෑසන කෘතවේදීව දෑත් එක්කොට නමස්කාර කරමින්, පාසල් ගොස් නැවත පැමිණ ගත කල දවස ගැන පසුවිපරම් කර මෙනෙහි කරමින් වන්දනාමාන කරමින් නමස්කාර කරන විට, බුදුන් වහන්සේ සහ ආදී මුතුන් මිත්තන් බොහෝ සතුටට පත්වේවි.

## රාජකාරියක් (වගකීමක්) තිබෙන පුද්ගලයා

# බුදුන් වහන්සේගේ දරුවන් වන අපිට පැවරී තිබෙන රාජකාරි (වගකීම්)

නික්යෝ නිවානෝ තුමා
නිර්මාතෘ, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය



රිෂ්ෂෝ කෝසෙයිකායි සංවිධානය තුල 'රාජකාරි (වගකීම්)' වලට විශාල වැදගත්කමක් ලබාදෙයි. 'අර පුද්ගලයා විශාල වගකීමක් දරන පුද්ගලයෙක්', 'ඔබට විශාල වගකීමක් පැවරිලා තිබෙනවා' යන වචන බොහෝ විට අසන්නට ලැබේ.

මේ කියන 'වගකීම', ශිබුචෝසාන් (ධර්ම නායකයන්), ශුනින් සාන් (පවුල් හෝසා නායකයන්) ට පමණක් පැවරී තිබෙන රාජකාරි නොවේ. සාමාජිකයන් සියළුදෙනාටම පැවරී තිබෙන (වගකීම්) වේ. එනම් සෑම කෙනෙකුටම ඉටුකිරීමට මෙහෙවරක් ඇති බවයි. අපි සැමදෙනාම ගෞරව කරන සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර ධර්මය ඉගෙනගන්නා විට එය ක්‍රමයෙන් අවබෝධවේ.

පලමුවෙන්ම, ‘උපායකෞෂල්‍යය’ යන දෙවන පරිච්චේදයේදී බුදුන් වහන්සේ ‘බුදුන් වහන්සේ මෙලොවට පහළ වු හේතුව’ පිළිබඳව දේශනා කර තිබේ. එසේ ‘ බුදුන් වහන්සේ මෙලොවට පහළ වුවේ’, සියළුසත්වයන්ව බුද්ධ මාර්ගයට ගනිමින්, සියළු සත්වයන්ව දුකින් මුදවා බුද්ධත්වය ශාක්ෂාත් කර ධර්මාවබෝධය දිය යුතුයි යන බුදුන් වහන්සේගේ මහත්වූ ප්‍රාර්ථනාවයි. සාමාජිකයන් වන අපි සියළුදෙනාම බුදුන් වහන්සේගේ එම අරමුණට සෘජුවම සම්බන්ධවී සිටින නිසා, අපි සියළුදෙනාටම පැවරී තිබෙන පොදුවූ ‘වගකීම’ නම්, බුදුන් වහන්සෙගේ දරුවන් ලෙස, බුදුන් වහන්සේගේ දූතයන් ලෙස, හැකිතාක් පුද්ගලයන්ව බුද්ධ මාර්ගයට ගනිමින් කටයුතු කිරීම වේ.

එසේම මේ මූලික ‘වගකිම්’ වලට අමතරව ධර්ම ශාඛාව තුල  තව ‘වගකීම්’ තිබේ. එම වගකීම් වල වැදගත්කමද සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ඉගෙන ගැනීමේදී හොඳින් අවබෝධවේ. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ මූලික කරුණු සාරාංශ කර බැලුවහොත්...

一 සියළුසත්වයන් ආදී බුද්ධ ශාක්‍යමුණීන්ද්‍රයන් වහන්සේගේ ආශිර්වාදය තුලින් ජීවත් වේ.

二 එම නිසා සියළුසත්වයන් සමානාත්මතාවයෙන් යුතුවේ. විවිධ සංසිද්ධීන් වලදී වෙනස්වූ රාජකාරි (වගකීම්) දරන්නට වන නමුත්, ඒ පැවරෙන වගකීම් නිවරදිව ඉටුකරන විට එතුලින්, ධර්මාවබෝධය කරා ලඟාවිය හැකිවේ.

三 මේ ලෝකයේ සියළුම සත්වයන් එකම ප්‍රජාවක් වන අතර, සියළුමදෙනා සත්‍යවශයෙන්ම සහයෝගයෙන් කටයුතු කලයුතුවේ. එලෙස සැම දෙනාම සහයෝගයෙන්, සමගියෙන් කටයුතු කරන තැන පරමාදර්ශී සමාජයක් ගොඩනැගෙනු ඇත.

මේ කරුණු 3 නැවත විග්‍රහ කර බැලූවිට, ඕනෑම රාජකාරියක (වගකීමක) ඇති වටිනාකම නිතැතින්ම අවබෝධවනු ඇතැයි සිතමි.

නික්යෝ නිවානෝ තුමා විසින් රචිත,
‘යහබත් බවේ බීජයන් වපුරමු’ ග්‍රන්ථයේ 48-50 පිටු ඇසුරිණි



# Director’s Column

## පුළුල් අහස් තලය යට, සතුට බෙදන්නෙකු වෙමි

කෙයිචි අකගාවා මහතා
අධ්‍යක්ෂක, රි.කෝ.කා. අන්තර්ජාතික මූලස්ථානය

සුභ දවසක් වේවා. මේ වසරේදීත් වසන්ත කාලය උදාවුනා. එසේම, අප්‍රේල් 8 වන දින ජපානයේ සමරන සිදුහත් උපතද බැති සිතියෙන් අපි සමරමු.

වසන්තයේ කාළගුණ වෙනස්වීම, මගේ සිතුවිලිත් වෙනතකට යොමු කලා මෙන් විශාල අතපසුවීමක් සිදුවුනා. ඒ රැකියා ස්ථානයේ බිල්ඩිමට ඇතුළුවන කාඩ්පත් යතුර නැතිවුනා. හැම තැනම බැලුවත් සොයාගන්න බැරිවුනා. නැතිවුනේ කොහෙද කියා මතකයක් නැහැ. ආපහු හොයාගන්න බැරිවේවි යන සිතුවිල්ලෙන් හදවත නලියන්නට වුනා.

නමුත් නැතිවු බඩු ගැන දැනුම්දෙන දුම්රිය කවුළුවට මම දුරකතන ඇමතුමක් දී ඒ ගැන පැවසුවිට, මාව පුදුමයට පත්කරමින් එක් දුම්රිය ස්ථානයක කාර්යාලයට එම කාඩ්පත් යතුර ඉතා කාරුණික පුද්ගලයෙකු ගෙනත් දුන් බව දැනගන්නට ලැබුනා. ඒ වෙනකොට කාඩ්පත් යතුර නැතිවී ඇතිබවට මම දැනගෙන පැය 4 ක් වත් ගතවී තිබුනේ නැහැ.

නොසැලකිලිමත්කම ගැන කලකිරීමෙන් සිටි මට, නැවත යතුර ලැබෙන බව දැනගත් මොහොතේ ඇස් ඉදිරිපිට ඇති සෑම දෙයක්ම දීප්තියෙන් බබලන්නට වුනා. නාඳුනන පුද්ගලයෙකුගෙන් ලැබුන කරුණාවන්ත බවට හදවත කෘතවේදීත්වයෙන් පිරිගියා.


මේ පුංචි කටුක අත්දැකීම තුලින් මම තදින්ම සිතාගත්තේ, මට උදව් කළ තැනැත්තා මෙන් මමද, මේ පුළුල් අහස් තලය යට අන්‍යයන්ට සතුට සැනසුම ලබාදෙන්නෙකු බවට පත්වෙන බවයි.




තායිවාන උතුරු ශාකාවේ, සාමාජිකයන් සමඟ
2024 පෙබරවාරි මස 25 වන දින




# A Global Buddhist Movement




Information about local Dharma centers

facebook

twitter

We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp